"පේරාදෙණියේ පිරිමි විදුහලක් ළඟ සුපිරි රූමතියන් ඉන්න ගණිකා මඩමක්" යන සිරස්තලයෙන් යුතු පුවතක් දිනමිණ පුවත්පතෙහි (දෙසැම්බර් 23, 2022) පළ වී තිබිණි. මෙම පුවත සමගින්, කාන්තාවකගේ ශරීරයේ පහත කොටස දැක්වෙන ඡායාරූපයක් ද යොදාගෙන තිබිණි. එසේම, මෙම ඡායාරූපයම මින් පෙරද, මීට සමාන පුවත් ඉදිරිපත් කිරීම සඳහා දිනමිණ පුවත්පත යොදාගෙන තිබූ බවද Ethics Eye අපි නිරීක්ෂණය කළෙමු.

ඔබ සිතන ලෙසට,

1) කාන්තාවන්ගේ බාහිර රූපය "රූමතියන්" වැනි විශේෂණ යෙදුම් ඔස්සේ ඉස්මතු කොට දක්වන්නේ, එම පුවතට හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) බවක් ලබාදීමට නොවේ ද?

2) එසේම, මෙම පුවත සඳහා මෙවැනි ඡායාරූපයක් යොදාගෙන ඇත්තේ ද, පුවතට හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) බවක් ලබාදීමට නොවේ ද? එසේ නැතිනම්, මෙම පුවත සඳහා මෙම ඡායාරූපයේ අදාළත්වය කුමක් ද?

3) "සුපිරි රූමතියන්", "ගණිකා මඩම්" වැනි යෙදුම් සහිත සිරස්තල සමගින් මෙවැනි ඡායාරූපයක් දිනමිණ පුවත්පත නැවත නැවතත් ඉදිරිපත් කිරීමෙන්, පොදුවේ කාන්තාව ලිංගික වස්තුවක් ලෙසින් දැක්වීමත්, ඒකාකෘතික කිරීමත් සිදු නොවන්නේ ද?

4) කාන්තාවන් ලිංගික වස්තූන් ලෙසින් ඒකාකෘතික කොට දක්වන භාවිතාවන්ට තිත තැබීම, ප්‍රගතිශීලී සමාජයක් වෙනුවෙන් කටයුතු කළ යුතු මාධ්‍යයක වගකීම නොවන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.

මූලාශ්‍ර:
https://www.veriteresearch.org/.../the-objectification.../
https://esource.dbs.ie/.../10788/341/ba_hogan_k_2012.pdf...
http://image.guardian.co.uk/.../05/29/joiningupthedots.pdf

මින් පෙර දිනමිණ පුවත් පිළිබඳ පෝස්ටුවට ප්‍රවේශය
මෙතැනින්: **https://www.facebook.com/.../a.23402767.../1809268079428241/**